# පාලර්මේන්තුව වෙත වෙන ආදිවාසික හා ටෝරස් සමුද්‍රසන්ධිවාසික හඬ ජනමත විචාරණය

ඔස්ට්‍රේලියානුවෝ බොහෝ භූමිවල සිට පැමිණි, විවිධ වූ දහම් අදහන විවිධ භාෂා කතා කරන අය වෙති. ආදිවාසී හා ටෝරස් දූපත් සමුද්‍රසන්ධි දූපත්වාසී ජන කොටස් ඔස්ට්‍රේලියාවේ මුල් ජාතීන් වන අතර ඔවුහු අවුරුදු 65,000 කට අධික කාලයක් මෙහි වාසය කර තිබේ. එහෙත් ඔස්ට්‍රේලියානු ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව මගින් ඔවුන්ගේ සුවිශේෂී තත්ත්වය පිළිනොගනියි. මේ වසරේ අග භාගයේ දී ජනමත විචාරණයක් මගින් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව වෙනස්කිරීම පිළිබඳව සලකා බැලීමට හැකි බව අප අදහස් කරන්නේ එබැවිනි. මෙමගින් ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී පුද්ගලයන්ට බලපාන ගැටලුවල දී ඔවුන්ගේ අදහස්වලට සවන් දෙන බව තහවුරු කරන හඬක් තුළින් ඔවුන් අපගේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව තුළ හඳුනාගැනීමට සියලු ඔස්ට්‍රේලියානුවන්ට අවස්ථාව ලැබෙනු ඇත.

## හදවතින් ම සිදු කළ උරුලු ප්‍රකාශය (Uluru Statement from the Heart)?

2017 මැයි මාසයේ දී ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී පුද්ගලයන් 250කට වැඩි ගණනක් විසින් හදවතින් ම සිදු කළ උරුලු ප්‍රකාශය නිකුත් කරනු ලැබිණි. එමගින් සියලු ඔස්ට්‍රේලියානුවන් වෙනුවෙන් වඩාත් හොඳ අනාගතයක් නිමර්ාණය කරන ලෙස මෙන් ම ඔස්ට්‍රේලියානු පාලර්මේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාවට ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ ඇතුළත් කරන ලෙස අපෙන් ඉල්ලා සිටියි.

## පාලර්මේන්තුව වෙත වෙන ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ යනු කුමක්ද?

පාලර්මේන්තුව වෙත වන ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ යනු ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී ජනතාවට, ඔවුන්ට බලපෑම් සිදු වන නීති හා ප්‍රතිපත්ති සම්බන්ධයෙන් රජයට උපදෙස් ලබා දිය හැකි ආකාරයකි.

## ජනමත විචාරණයක් යනු කුමක්ද?

ජනමත විචාරණයක් යනු කිසියම් ප්‍රශ්නයක් හෝ ප්‍රශ්නවලට එකඟයි හෝ එකඟ නොවෙමි ලෙස පිළිතුරු දෙන ලෙස ඡන්දදායකයන්ගෙන් ඉල්ලා සිටින අවස්ථාවකි. ඔස්ට්‍රේලියාවේ ආණ්ඩුක්‍රම ව්‍යාවස්ථාව වෙනස් කිරීමට ඇති එක ම ක්‍රමය ජනමත විචාරණයක් තුළිනි.

## ජනමත විචාරණයේ දී ඡන්දය භාවිතා කළ හැක්කේ කාටද?

ඡන්දය භාවිතා කිරීමට ලියාපදිංචි වී සිටින පුද්ගලයන්ට පමණක් ජනමත විචාරණයට සහභාගී වීමේ අවස්ථාව ඇත. ලියාපදිංචි ඡන්දදායකයින් විසින් ජනමත විචාරණයේ දී ඡන්දය භාවිතා කිරීම අනිවායර් වේ.

## ජනමත විචාරණයේ දී මා ඡන්දය භාවිත කරන්නේ කෙසේද?

ජනමත විචාරණ මැතිවරණ හා සමාන වේ. මැතිවරණ දිනයේ දී ඔබ ඡන්ද මධ්‍යස්ථානයකට ගොස් ඔබේ ඡන්දය මැතිවරණ පත්‍රිකාවක් මත සළකුණු කිරිම සිදු කරයි.

## ජනමත විචාරණයක් තීරණය වන්නේ කෙසේද?

ජනමත විචාරණයක් සාථර්ක වීම සඳහා ද්විත්ව බහුතරයක් අවශ්‍ය වේ. එයින් අදහස් වන්නේ සමස්ත ඔස්ට්‍රේලියාවේ ප්‍රාන්ත අතරින් හතරක දී වත් බහුතරයක් ඡන්ද අවශ්‍ය වන බවයි.

## ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ ජනමත විචාරණ පැවැත්වෙන්නේ කවදාද?

ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ ජනමත විචාරණය මේ වසරේ අගභාගයේ දී පැවැත්වේ.

## ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ ජනමත විචාරණය මගින් අසනු ලබන ප්‍රශ්නය කුමක්ද?

“යෝජනා කෙරෙන නීතිය: ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬක් ස්ථාපනය කිරීම මගින් ඔස්ට්‍රේලියාවේ මුල් ජාතීන්ට පිළිගැනීමක් ලබා දීමට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව වෙනස් කිරීම. ඔබ මෙයට එකඟ වන්නේ ද”

## මෙම තොරතුරු පත්‍රිකාව නිමර්ාණය කර ඇත්තේ කා විසින් ද?

මෙම තොරතුරු පත්‍රිකාව Life Without Barriers, Reconciliation Australia, SNAICC – National Voice for our children, Yes Alliance සහ Polaron Language Services හි සහයෝගයෙන් නිමර්ාණය වී ඇත.

පාලර්මේන්තුව වෙත වන ආදිවාසී හා ටෝරස් සමුද්‍රසන්ධි දූපත්වාසී හඬ සම්බන්ධයෙන් ප්‍රවේශීය තොරතුරු ලබා ගැනීම සඳහා මෙම සහයෝගීත්වය සකස් කර තිබේ.

**වැඩිදුර තොරතුරු**

www.lwb.org.au



අවසරය සහිතයි Tabatha Feher, Life Without Barriers, L6, 107 Pitt St, Sydney, NSW.